IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව 2018**

**(දෙවන සෙමෙස්තරය)**

**පවත්වන ලද්දේ 2020 ජනවාරි**

**DCP 1006 - අසාමාන්‍ය මනෝවිද්‍යාව**

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) හා පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. මාලනී ඇයගේ දික්කසාදයෙන් පසු ජීවත්වූයේ ඇයගේ එකම පුතා සමගයි. ඇයගේ පුතා වැඩිදුර අධ්‍යාපනය සඳහා මීට වසරකට පෙර ජර්මනියට ගොස් ඇත. මීට මාස හතරකට පෙර ඔහු හදිසියේ බලාපොරොත්තු නොවූ අවස්ථාවක ඔරු පැදීමට ගොස් අනතුරකින් දියේ ගිලී මියගොස් ඇත.

1.1 මාලනී අත්විඳින සාමාන්‍ය වියෝ දුක ප්‍රතික්‍රියාව පැහැදිලි කරන්න.

1.2 මාලනීට ලබාදෙන වියෝ දුක උපදේශනයේ දී ඔබ යොදා ගන්නා මූලධර්ම පැහැදිලි කරන්න.

1.3 මාලනීට ලබාදෙන වියෝ දුක උපදේශනයේ දී ඔබ යොදා ගන්නා උපාය මාර්ග විස්තර කරන්න.

(ලකුණු - 20)

Malini is a divorced lady and lived with her only son. Her son migrated to Germany for further studies one year ago. Four months ago her son met with a sudden and unexpected death following drowning as a result of a boat accident.

1.1 explain the normal grief reaction experienced by Malini

1.2 explain the principles you will use to provide grief counseling to Malini

1.3 describe the strategies you will use to provide grief counseling to Malini

(20 Marks)

2. වරුණි පැනඩෝල් පෙති 25ක් බී ඇත.

2.1 ඇයගේ සියදිවි හානිකර ගැනීමේ අවදානම තක්සේරු කරන්න.

2.2 වරුණිගේ සියදිවි හානිකර ගැනීමේ අවදානම අධික නම් ඇයට ලබාදෙන උපදේශනය පැහැදිලි කරන්න.

2.3 ශ්‍රී ලංකාවේ සියදිවි හානිකර ගැනීම වැළැක්වීමේ ප්‍රතිපත්තිය විස්තර කරන්න.

(ලකුණු - 20)

Waruni has taken an overdose of 25 Panadol tablets

2.1 Describe how you would assess the suicide risk

2.2 Explain how you would counsel Waruni if the suicide risk is high

2.3 Discuss the suicide prevention policy in Sri Lanka

(20 Marks)

3. අසංක ඔහුගේ ආදර සම්බන්ධතාවය නැතිවීම නිසා අසහනයෙන් පසුවෙයි.

3.1 මෙම අවස්ථාවට මුහුණ දීමට අසංක විසින් යොදාගත හැකි සාධනීය නොවන උපාය මාර්ග 3 ක් කෙටියෙන් විස්තර කරන්න

3.2 ඔබ විසින් සාධනීය උපාය මාර්ග උපයෝගී කරගනිමින් අසංකට ලබාදෙන උපදේශනය පැහැදිලි කරන්න

(ලකුණු - 20)

Asanka is distressed following a breakdown of his relationship with his fiancé

3.1 name 3 maladaptive coping strategies Asanka might use

3.2 explain how you would counsel Asanka using adaptive coping strategies

(20 Marks)

4. පහත සඳහන් පද පැහැදිලි කරන්න

4.1 ග්‍රස්තිය

4.2 අනිවාර්ය හැසිරීම්

4.3 ප්‍රතිචාර වැළැක්වීමේ ප්‍රතිකාරය

4.4 යම් හැසිරීමකට හුරුකිරීමේ ප්‍රතිකාරය

(ලකුණු - 20)

Explain the following:

4.1 obsessions

4.2 compulsions

4.3 response prevention therapy

4.4 habituation therapy

(20 Marks)

5. 5.1 දුම්පානය නැවැත්වීමට කැමති පුද්ගලයකුට ඔබ ලබාදෙන උපදේශනය විස්තර කරන්න

5.2 දුම්පානය නැවැත්වීමට අකැමති පුද්ගලයකුට ඔබ ලබාදෙන උපදේශනය විස්තර කරන්න

(ලකුණු - 20)

. Describe how you would provide counseling:

5.1 to a person motivated to quit smoking

5.2 to a person not motivated to quit smoking

(20 Marks)

6. පහත සඳහන් අවස්ථාවලදී ලබාදෙන උපදේශන ක්‍රමවේදයන් සැකවින් සඳහන් කරන්න.

6.1 සමාජ භීතිකාව

6.2 ලිංගික බෙලහීනතාවය

6.3 කායරූපික අක්‍රමිකතාවය

6.4 පසු ප්‍රසව විශාදය

(ලකුණු - 20)

Outline the counseling methods used in following situations:

6.1 social phobia

6.2 erectile dysfunction

6.3 somatoform disorder

6.4 postpartum depression

(20 Marks)

7. පහත සඳහන් අවස්ථාවලදී ලබාදෙන උපදේශන ක්‍රමවේදයන් පැහැදිලි කරන්න

7.1 නින්ද නොයාම
7.2 සංත්‍රාස කාංසාව

(ලකුණු - 20)

Explain the following:

7.1 person presenting with insomnia
7.2 person presenting with panic disorder

(20 Marks)

8. පහත සඳහන් අවස්ථා පැහැදිලි කරන්න

8.1 මත්පැන් නිසා සිදුවන හානිය
8.2 මත්පැන්වලට ඇබ්බැහිවූවකු පෙන්වන ලක්ෂණ
8.3 ගැටළු සහිත මත්පැන් පානය කරන්නකු හඳුනා ගැනීම සඳහා උපයෝගී කරගන්නා CAGE පරීක්ෂණය
8.4 ගැටළු සහිත මත්පැන් පානය කරන්නකුහට ලබාදෙන කෙටි මැදිහත්වීම

(ලකුණු - 20)

Explain the following:

8.1 alcohol related harm
8.2 features of alcohol dependence
8.3 CAGE screening test to recognize problem drinkers
8.4 brief intervention for problem drinkers

(20 Marks)

********************